# සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍ය පුද්ගල කණ්ඩායම් උදෙසා ක්‍රියාත්මක වූ බෞද්ධාගමික හර පද්ධතීන්ගෙන් පෝෂණය වූ පැරණි ලක්දිව අයිතිවාසිකම් පිළිවෙත

දර්ශන බණ්ඩාර[1]

## හැඳින්වීම

ඕනෑම සමාජයක ජීවත්වන සාමාජිකයන්ගෙන් කොටසක් විශේෂ රැකවරණයක් අවශ්‍ය සාමාජිකයන් වේ. සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍ය කරන කණ්ඩායම් උදෙසා නූතනයේ ද අයිතිවාසිකම් හා විශේෂ රැකවරණයක් ලබා දීම සිදු වේ. විශේෂයෙන් කාන්තා හා ළමයින් ද වයෝවෘද්ධ තැනැත්තන් සහ රෝගාබාධවලින් අසරණ වූ තැනැත්තන් ද යුද්ධවලින් පීඩාවට පත් වූ අභ්‍යන්තර අවතැන් වූවන් සහ සරණාගතයන්ද විශේෂ රැකවරණයක් අවශ්‍ය කරන කණ්ඩායම් ලෙස නූතන නීතින්ගේ රැකවරණය ලබයි. බෞද්ධාගමික ඉගැන්වීම්වලින් පෝෂිත පැරණි ලක්දිව රාජ්‍ය පාලකයින් විශේෂ රැකවරණයක් අවශ්‍ය පුද්ගල කණ්ඩායම් උදෙසා රැකවරණය ලබා දී ඇති බව මූලාශ්‍ර සාක්ෂි අනුව හඳුනාගත හැකි ය. සමාජයේ රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය කරන කණ්ඩායම් සඳහා අදාළ වන නීති පනවා ඒ අනුව කටයුතු කිරීමට රාජකියන් උනන්දු වූ බව පැහැදිලි ය. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ සමාජ රැකවරණය අවශ්‍ය පුද්ගල කණ්ඩායම් උදෙසා රාජ්‍යයෙන් ලැබුණු රැකවරණය පිළිබඳව කරුණු විමසා ඇත. සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍ය කණ්ඩායම් උදෙසා ක්‍රියාත්මක කළ අයිතිවාසිකම් ප්‍රතිපත්තියට බෞද්ධාගමික හර පද්ධතීන් බලපා ඇති අන්දම එහිදී විවරණය වේ.

## අරමුණු සහ වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ අතීත සමාජ පැවැත්ම තුළ සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍යය පුද්ගලයන් උදෙසා රජය මගින් ක්‍රියාත්මක වූ ප්‍රතිපාදන කෙරෙහි විශේෂ අවධානය යොමු වේ. ශ්‍රී ලංකාව බුදු දහමින් පෝෂණය වූ රාජ්‍යයක් වන නිසා සමාජ ක්‍රමයේ හැඩතල සකස්ව ඇත්තේ බෞද්ධාගමික ආභාසයෙනි. මෙරට රජවරු තම පුණ්‍යක්‍රියාවලදී පිං රැස් කිරීමේ මාධ්‍යක් ලෙස ද, සමාජ රැකවරණය පිළිබඳව රජවරුන්ට පැවති වගකීම මතද විශේෂ අවශ්‍යතා ඇති සමාජ කණ්ඩායම් වලට තම අවධානය යොමුකළ බව මූලාශ්‍රවලින් පැහැදිලි වේ. විශේෂයෙන් ම බෞද්ධාගමික ප්‍රතිපත්ති ප්‍රායෝගිකව රජවරු භාවිත කිරීමේදී අතීත ලංකාවේ සිදුකළ බොහෝ ක්‍රියා පිළිබඳව මූලාශ්‍රවල තොරතුරු දක්වේ. නමුත්

---

1 කථිකාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය

සමාජයේ පරිධිගත වී ඇති නිර්ප්‍රභූ ජන කණ්ඩායම් පිළිබඳ පසුකාලීන පර්යේෂකයන්ගේ අවධානය යොමුව ඇත්තේ මඳ වශයෙනි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේද සමාජයේ පරිධිගත වූ සාමාජිකයන් කෙරෙහි රාජ්‍යත්වයේ මැදිහත්වීම විමසා බැලීමය. එහිදී සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍ය කණ්ඩායම් කෙරෙහි ක්‍රියාත්මක වූ රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි බෞද්ධාගමික මැදිහත් වීම විමසා බැලීම මෙම අධ්‍යයනයේ වැදගත්කම ලෙස හැඳින්විය හැකිය.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය භාවිතයෙන් සිදු කරන ලදී. එහිදී ප්‍රාථමික මූලාශ්‍ර පරිශීලනය මගින් හඳුනාගන්නා ලද තොරතුරු සහ පසුකාලීන ලේඛකයන්ගේ කෘති භාවිතයෙන් හඳුනාගත් තොරතුරු අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ ගැඹුරින් සාකච්ඡාවට ලක්කොට ඇත. පැරණි ලක්දිව සමාජයේ විශේෂ අවශ්‍යතා පැවති ජන කණ්ඩායම් පිළිබඳ මූලාශ්‍රගත සැඟව පවත්නා තොරතුරු විමර්ශනය මෙහිදී සිදුවිය.

## සමාජ රැකවරණය අවශ්‍ය විශේෂ පුද්ගල කණ්ඩායම් උදෙසා පැවති මානව අයිතිවාසිකම්

සමාජයේ විශේෂ අවධානයට ලක්විය යුතු කණ්ඩායම් කෙරෙහි රජවරු මෙරට සිදු කරන ලද යුතුකම් එම පිරිසෙහි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හේතු වී ඇත. විශේෂයෙන් ම අසරණභාවයට පත් වූ රෝගීන්ට සහ කාන්තා ළමා කණ්ඩායම්වලට මෙන් ම උපතින්ම ආබාධ සහිත පිරිස්වලට විවිධ රජවරු ලබාදුන් රැකවරණයන් කිහිපයක් පහත දැක්වේ. එකී රජවරුන්ගේ රැකවරණය අදාළ කණ්ඩායමේ සුවිශේෂීත්වය හේතුවෙන් රාජ්‍ය වෙතින් ලැබුණු අයිතිවාසිකම් ලෙස සැළකිය හැකි ය.

- සිරිමේඝවර්ණ රජු දුගිමගී යාචකයන්ට මහ දන් දී ඇත (මහාවංසය, 37 පරි: 75 ගාථාව).
- බුද්ධදාස රජු ගිලනුන්ට වෙදකම් කර ඇත. බුද්ධදාස රජු සාරාර්ථ සංග්‍රහය ලියවා ඇති අතර ගම් දහයකට වෛද්‍යවරයෙකු බැගින් පත්කර ඇත (මහාවංසය, 37 පරි: 111, 145, 147 ගාථා).
- බුද්ධදාස රජු දරු ඵල නොලද ගබ්සාවට ලක් වූ කෙලිලොල්ගම චණ්ඩාල ස්ත්‍රියකට සාර්ථක ගැබිණියක් වීමට වෙදකම් කොට ඇත (මහාවංසය, 37 පරි: 140 ගාථාව)
- බුද්ධදාස රජු කොරුන්ටය සහ අන්ධයන්ට මාර්ගයෙන් සුදුසු තැන්වල වැටුප් සහිත ශාලා කරවා සත්කාර කර ඇත (මහාවංසය, 37 පරි: 147 148 ගාථා).

- පළමු වන උපතිස්ස රජු කොරුන්ට ද දරු ප්‍රසූතිය සඳහා සිටින ස්ත්‍රීන්ට ද අන්ධයින්ට ද රෝගීන්ට ද මහත් භෝග ඇති ශාලාවන් ද දන් සල් ද කරවීය (මහාවංසය, 37 පරිː 182 ගාථාව).
- මහානාම රජු ගිලන්හල් කරවා මහාපාලි බත් හල ද වැඩි දියුණු කරවීය (මහාවංසය, 37 පරිː 212 ගාථාව).
- දෙවන සලමෙවන් මිහිඳු රජු අනාථ වූ ලැජ්ජාශීලී යම් කෙනෙක් වී නම් රජු ඔවුන්ටද රහසේ සංග්‍රහ කළේය (මහාවංසය, 46 පරිː 148 ගාථාව).
- දෙවන දප්පුල රජු අනාත වූ කුලවත් ස්ත්‍රීන්ට පළඳනා දුන්නේ ය. බොජුන් කැමැත්තවුන්ට බොහෝ සේ රාත්‍රී භෝජනය දුන්නේය (මහාවංසය, 47 පරිː 35 ගාථාව).
- දෙවන උදය රජු දුර්භික්ෂ කාලයෙහි දන්සල් කරවා සියලු දෙනාට මහ දන් පවත්වා නිරන්තරයෙන් දුගියන්ට බත් ද කැවිලි සහිත කැඳ ද දී ඇත. (මහාවංසය, 49 පරිː 132, 133 ගාථා).
- සිව්වන කාශ්‍යප රජු ඒ ඒ ප්‍රදේශවලින් පැමිණි යාචකයන්ට ශිල්පීන්ට හැම කාලයේම දණ්ඩිස්සර නම් දානයක් දී ඇත (මහාවංසය, 50 පරිː 3 ගාථාව).

මහාවංසයේ දැක්වෙන මෙම තොරතුරු මගින් අතීත ලංකාවේ පැවති විශේෂ සමාජ රැකවරණය අවශ්‍ය කණ්ඩායම්වලට හිමි වූ රාජ්‍ය රැකවරණය පැහැදිලි වේ. ආහාර නවාතැන් වැටුප් බෙහෙත් ආරක්ෂාව වැනි විශේෂ අවශ්‍යතා ඇති පිරිස්වලට හිමි විය යුතු එක් අතකින් මූලික අවශ්‍යතා ද තවත් අතකින් අයිතිවාසිකම් ද හිමි ව ඇති අන්දම මෙම තොරතුරුවලින් මනාව තහවුරු වේ.

ශිලා ලේඛන මූලාශ්‍රවල ද විශේෂ සමාජ රැකවරණය අවශ්‍ය පිරිස්වලට අවශ්‍ය සහන සැලසූ බව රජවරු සඳහන් කර ඇති බව හඳුනාගත හැකි ය. පොළොන්නරු රාජධානි සමයේ දී ද විශේෂ සමාජ රැකවරණය අවශ්‍ය පිරිස්වලට අදාළ රැකවරණය ලැබී ඇති බවට මූලාශ්‍ර සාක්ෂි සපයයි. මහා විජයබාහු ශත වර්ෂයකට ආසන්න කාලයක් සොළීන් යටතේ පැවති රජරට රාජධානිය මුදවාගත් මහා විජයබාහු රජුට විශාල සමාජ සුබ සාධනයක් සිදු කිරීමට සිදු විය. එහි දී විජයබාහු රජු වැන්දඹු කුල කාන්තාවන්ට ආහාර වස්ත්‍ර මෙන් ම ගම්වර ද සපයා ඇත (මහාවංසය, 60 පරිː 94 ගාථාව). මහා පරාක්‍රමබාහු රජු විසින් පනවන ලද පොළොන්නරු ගල් විහාර සෙල්ලිපිය භික්ෂූන් වහන්සේලා සඳහා කරවන ලද කතිකාවක් වුව ද එහි සත්තාහකරණයෙන් තම රෝගී වූ ඥාතීන්ට හා හිතවතුන්ට අනුග්‍රහ කිරීමට භික්ෂුවකට යෑමට තිබූ විනය ශික්ෂාව ලිහිල් කර ඇත. මේ පිළිබඳ ව ධම්මිකා ගමගේ අදහස් කරනුයේ රෝගාබාධිතයන්ට සහන සැලසීමේ මෙරට අතීතයේ සිට පැවති සමාජ සිරිතකට ගරු කිරීම සඳහා අදාළ ශික්ෂාව ලිහිල් කරන්නට ඇති බව යි (ගමගේ, 2009ː 69). නිශ්ශංක මල්ල රජු ද ඔහුගේ ගල්පොත ශිලා ලේඛනයේ අනාථ ජනයාගේ යහපත වෙනුවෙන් ඉටුකළ යුතුකම් සඳහන්කර ඇති අතර ඒවා අසරණ පුද්ගලයන්ගේ රැකවරණය පිළිබඳ අයිතිවාසිකම් ලෙස දැක්විය හැකි ය (EZ Vol II 1928: 106). සමාජයේ අසරණ තත්වයට පත් වූ සාමාජිකයන් උදෙසා පැරණි ලක්දිව ක්‍රියාත්මක වූ මානව අයිතිවාසිකම් සුරක්ෂිත

කිරීමේ ව්‍යවහාරය රෝහණයට ද පොදු වූ පෙර සිරිතක් ලෙස සඳහන් කළ හැකි ය.

විශේෂ සමාජ රැකවරණය අවශ්‍ය ළමා පරපුරේ අයිතිවාසිකම් සුරක්ෂිත කළ අවස්ථා සෙල්ලිපි මූලාශ්‍රවලින් ද හමුවේ.

1. දළහා නම් වූ සෙන්පතියෙකු දාසභාවයේ සිටින සියලු මළමයින් මිදවිය යුතු බවට නියෝගයක් මුරුතව සෙල්ලිපියේ සඳහන් වේ.
2. පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය මගින් වයසින් අඩු දරුවන් මහණ නොකළ යුතු බව පැහැදිලි ව සඳහන් කර ඇත.

ශ්‍රී ලංකාවේ ළමා පරපුරට නිදහසේ ජීවත් විය හැකි සමාජ වටපිටාවක් නිර්මාණය කිරීමට උක්ත ශිලා ලේඛන 2 මගින් ප්‍රතිපත්තිමය වශයෙන් උත්සාහ ගෙන ඇති බව පැහැදිලි ව හඳුනාගත හැකි ය. ළමයෙකු යනු මානව සමාජයේ කුඩාම පුද්ගලයෙකු වන නිසා සියලු මිනිසුන්ට අයත් අයිතිවාසිකම් ළමයින්ට ද හිමි විය යුතු ය. අතීත රෝහණයේ පවා රජරට ශිෂ්ටාචාරයේ මෙන් සමාජයේ විශේෂ රැකවරණය අවශ්‍ය පිරිස්වලට ආරක්ෂාව පැවති බව සඳහන් කළ හැකි ය.

**සමාලෝචනය**

උක්ත කරුණු සියල්ලම සලකා බැලූ විට ඉතා පැහැදිලි ව රජරට ශිෂ්ටාචාර සමයෙහි සමාජයේ ශිෂ්ට රැකවරණ අවශ්‍ය කරන කණ්ඩායම්වලට අදාළ රැකවරණ හිමිව ඇති බව පෙනී යයි. ශ්‍රී ලංකාවේ නීතියේ පැවති මෙම රැකවරණය විශේෂ අවශ්‍යතාවයක් ඇති කණ්ඩායම්වල ජීවිත පැවැත්ම හා සුරක්ෂිතභාවය තහවුරු කිරීමට බලපා ඇත. සමාජීය යුතුකමක් වන මෙම අයිතිවාසිකම් පැරණි ලක්දිව සමාජ සභ්‍යත්වය පිළිබඳ ඉතා ඉහළ මිනුම්දණ්ඩක් ලෙස හැඳින්විය හැකි ය. මෙම අයිතිවාසිකම් ප්‍රදානය සඳහා මෙරට රජවරුන් කෙරෙහි බෞද්ධාගමික ඉගැන්වීම් දැඩිව බලපාන්නට ඇති බව විශ්වාස කළ හැකිය. මූලාශ්‍රගත සාක්ෂි අනුව පැරණි ලක්දිව සමාජ රැකවරණය පිළිබඳ මානව අයිතිවාසිකම් පිළිවෙත බෞද්ධාගමික හර පද්ධතීන්ගෙන් පෝෂණය වූ බව පැහැදිලිව සටහන් කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** බෞද්ධාගමික රාජ්‍ය ප්‍රතිපත්ති, අයිතිවාසිකම්, විශේ අවශ්‍යතා ඇති කණ්ඩායම්, සමාජ රැකවරණය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*පූජාවලිය.* (1951). (සංස්). පොල්වත්තේ බුද්ධදත්ත, කොළඹ: එම්.ඩී.ගුණසේන සහ සමාගම.

*මහාවංශය.* (2004). (සංස්.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*වංසත්ථප්පකාසිනී.* (1994). සිංහල අනුවාදය. අකුරැටියේ අමරවංශ සහ සෝමචන්ද්‍ර දිසානායක, කැළණිය: විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය.

ගමගේ, ධම්මිකා ප්‍රියදර්ශනි (2009). *ශ්‍රී ලංකාවේ සෙල්ලිපිවලින් හෙළිවන මානව අයිතිවාසිකම්.* කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.